12

# අන් අයට උදවු කරමු

وَتَعَاوَنُوْا عَلَى الْبِرِّ وَالتَّقْوٰى وَلَا تَعَاوَنُوْا عَلَى الْاِثْمِ وَالْعُدْوَانِ

**"...තව ද යහපත් පුණ්‍ය කටයුතුවලදී ද, බිය බැතිමත්භාවයේ දී ද, එකිනෙකාට සහාය වනු. පාපකාරී (කටයුතු) හා සීමාව ඉක්මවා යාම (කටයුතුවල) ට නුඹලා එකිනෙකාට සහාය නොවනු..."(5:2)**

අල්ලාහ් තආලා මෙලොව ද, එහි ඇති සියල්ල සමහර නිර්ණායක, පදනමින් මවා පරිපාලනය කරයි. සියලු ජීවීන් එකිනෙකා මත යැපෙමින් ජීවත් වීමේ ක්‍රමයට ඔහු මවා ඇත්තේ ය. මිනිසා මවා ඇත්තේ ඉතා උතුම් මැවුමක් වශයෙනි. ලොව හොඳ සමාජයක් බිහි කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දී ඇත. මෙම දේව මාර්ගෝපදේශය ඉස්ලාම් ආගම වන්නේ ය.

ඉස්ලාමය පිළිගත් සියල්ලන් ම මිනිස් සමාජයේ ප්‍රවර්ධනය සඳහා මෙන් ම දියුණුව උදෙසා ද කැපවිය යුතු බව ඉස්ලාම් අවධාරණය කරයි. මෙය මෙම පාඩම ආරම්භයේ ඇති කුර්ආන් වැකියෙන් (5:2) පෙන්වා දෙන්නේ ය.



මුඃමින්වරයෙකුගේ සියලු ම ක්‍රියාකාරකම් අන් අයට ප්‍රයෝජන ලබා දෙන ඒවා විය යුතු යි. ඔහු තමා වෙනුවෙන් පමණක් නොව අන් අය වෙනුවෙන් ද ජීවත් විය යුතු ය. එවිට ය ඔහුගේ ජීවිතය අර්ථවත් වනුයේ.

''මිනිසුන් අතර සිටින හොඳ පුද්ගලයා මිනිසුන්ට වඩාත් ප්‍රයෝජනවත් වන්නා ය.''(බයිහකී) යන හදීසයට අනුව, මුස්ලිම්වරයකු ජාති, ආගම්, කුල, වර්ණ භේද නොතකා සමාජයට ප්‍රයෝජනවත් මිනිසකු සේ සිටිය යුතු ය යන්න අවබෝධ කරයි.''

අල්ලාහ්තආලාට වඩා ප්‍රියමනාප තැනැත්තා, මිනිසුන්ට ප්‍රයෝජනවත් වන්නා ය. මුස්ලිම්වරයකුගේ සිතෙහි සතුට ඇති කිරීම, ඔහුගෙන් දුක ඉවත් කිරීම, ඔහුගේ ණය බේරීම, ගෞරවය රැකීම, යහපත පනවා අයහපත වැළැක්වීම, මහමාර්ගයේ ඇති ගල්මුල් ඉවත් කිරීම, අන්ධයන්, බිහිරන්, ගොළුවන් වැනි අයට උදවු කිරීම, පිපාසයෙන් සිටින්නන්ට ජලය පෙවීම, කුසගින්නෙන් පෙළෙන්නන්ට කෑම දීම, බෙලහීනයන්ට උරදීම, ආදී සියල්ල අල්ලාහ්ගේ සෙනෙහස ලබා දෙන ක්‍රියාවන් ය.

''තමා කැමති දෙය තම සහෝදරයා වෙනුවෙන් ද කැමති වන තෙක් ඔබගෙන් කිසිවකු සැබෑ විශ්වාසවන්තයා නොවනු ඇත. (බුහාරි, මුස්ලිම්)

සමාජයේ සිටින අනාථයින්, වැන්දඹුවන්, ශාරීරික ඌනතා ඇති අය, දුගීන්, කාන්තාවන්, බාලයින් වැඩිහිටියන් වැනි දුර්වලයින් සුරැකිය යුත්තන් වනවා. ඔවුන් සමඟ ආදර කරුණාවෙන් හැසිරිය යුතු ය. ඔවුන් පහත් කොට හෝ බරක් වශයෙන් හෝ නොසැලකිය යුතු ය. ඔවුහු අල්ලාහ් ආසන්නයේ ගෞරවයට පාත්‍ර වූවෝ ය.

''තව ද, අල්ලාහ්ට අවනත වන්න. ඔහුට කිසිවක් සම නොකරන්න. තව ද,මව්පියන්ටත් කිට්ටු නෑදෑයින්ටත්, අනාථයන්ටත්, දුගීන්ටත්, අසල්වැසි නෑදෑයින්ටත්, ගමනක යෙදෙන්නන්ට හෝ මඟීන්ටත් අසල්වැසි නෑදෑයින් නොවන අයටත්, (ගමන් බිමන් හා රැකියාවල යෙදී සිටින්නන්ටත්) මිතුරන් ව සිටින්නන්ටත්, ඔබ ළඟ සිටින වහලුන්ටත් ආදරයෙන් උදවු උපකාර කරන්න. සැබවින් ම අල්ලාහ් ආඩම්බරකාරයන්ටත්, අනවශ්‍ය උඩගු අයටත් ළෙංගතු නො වෙයි.” ( 4:36)

ඔබට උදවු කරනු ලබන්නේත් කෑම බීම දෙනු ලබන්නේත්, ඔබ අතර සිටින්නා වූ දුර්වලයින් හේතුවෙනි. (අබූ දාවුද්)

අල් කුර්ආනය විවිධ ස්ථානවල ඉබාදත් කරන ලෙස පවසා යහපත් ක්‍රියාවන් කරන්නැයි පවසයි. ''ඊමාන්ධාරීනි, ඔබ රුකූඃ කරන්න. සුජූද් කරන්න. යහපත් ක්‍රියාවල යෙදෙන්න. ඔබ ජය ලබන්නේ ය.''(අල් කුර්ආන් 22ඃ 77)

''විසඳුම් දිනය අසත්‍ය යැයි සලකන්නා දෙස ඔබ බැලුවා ද? ඔහු අනාථයින් පන්නා දමයි. දුප්පතුන්ට ආහාර දෙන්න යැයි ඔහු පොළඹවනු ලබන්නේ නැත.'' (107ඃ 1 - 3)

නැමදුම් හා වත් පිළිවෙත්වල යෙදීම මෙන් ම සමාජයේ සිටින දුර්වලයන් වෙනුවෙන් වැඩ කිරීම ද වගකීමකි. එකක් හැර අනෙක පමණක් කළේ නම්, කිසි විටෙකත් කියාමාවේ දී ජය අත් නොවන්නේ ය. ඉස්ලාමීය සමාජයේ සිටින කිසිදු සාමාජිකයකු අත් නොහරිනු ලැබිය යුතු ය.

''සියල්ලන්ගේ ම සැප දුක්වලට සහභාගි විය යුතු ය. එමගින් පමණි සමාජයේ සංවිධානාත්මක බව හා ස්ථාවර බව රැකෙන්නේ. ඒ නිසා නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් මුස්ලිම් සමාජය සිරුරකට සමාන කළේ ය.

''එකිනෙකාට සෙනෙහස දැක්වීමේ දී හා කරුණාව දැක්වීමේ දී මුස්ලිම්වරුන් එක් සිරුරකට සමාන ය. එහි එක් කොටසක් රෝගවූවත් අනෙක් අවයව ද ඇහිරී සිටිමින් (උණෙන් පෙළී) එම දුකෙහි කොටස් කරුවකු වන්නේ ය. (බුහාරි මුස්ලිම්)



එක් මුස්ලිම්වරයෙක් අනෙක් මුස්ලිම්වරයාගේ සොයුරා ය. ඔහු අනෙක් මුස්ලිම්වරයාට අසාධාරණයක් නො කරයි; ඔහු අසරණ නො කරයි. (බුහාරි, මුස්ලිම්)

මුස්ලිම් වූ අයකු අනික් සොයුරාට ප්‍රයෝජනවත් අයකු ව ජීවත් වන විට ඔහුගේ සිත පුළුල් වන්නේ ය. කෑදරකම ඉවත් වන්නේ ය. අල්ලාහ්ගේ ආදරය හා කරුණාව හිමි වන්නේ ය. කියාමාවේ දුක් වේදනාව ඉවත් වන්නේ ය.

''කවරකු මුස්ලිම්වරයකුගේ දුක් වේදනා ඉවත් කර ඔහු සතුටට පත් කරන්නේ ද, අල්ලාහ් කියාමා දිනයේ දී ඔහුගෙන් එම දුක් වේදනා ඉවත් කර ඔහු සතුටු කරන්නේ ය. (බුහාරි මුස්ලිම්)

**අභ්‍යාසය**

1. මුස්ලිම්වරුන් අතර වෙනසක් නොපවතින අයුරින් අන් අයට උදවු කළ යුතු බව පෙන්වන හදීසය සඳහන් කරන්න.
2. මිනිසුන් ට ප්‍රයෝජනවත් වන අයකු ලෙස ජීවත් වීම පිළිබඳ උදාහරණ පහක් ඉදිරිපත් කරන්න.
3. සමාජය විසින් සුරැකිය යුතු දුබලයන්ගේ ලැයිස්තුවක් ඉදිරිපත් කරන්න.
4. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා මුස්ලිම් සමාජය සිරුරේ අවයවවලට සමාන කර තිබීමේ හේතුව පහදන්න.